මගේ අංකය :- SP/PSC/31/02/33/01
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
6 වන මහල, කළුවැල්ල, ගාල්ල.
2024.10.09

ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය,
දකුණු පළාත.

**දකුණු පළාත් නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගෙවල් කුලී මණ්ඩල බලයලත් නිලධාරී තනතුරෙහි II/I ශ්‍රේණි වල නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

**Efficiency Bar Examination for House Tenancy Board Authorized Officer Grade II/I Officers in Department of Housing, Southern Province - 2024**

1.0 අංක 78 හා 2011.06.28 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ බලයලත් නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව දකුණු පළාත් රාජ්‍ය සේවයේ බලයලත් නිලධාරී තනතුරෙහි II/I ශ්‍රේණි වල නිලධාරීන් විසින් සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් මෙම කොමිෂන් සභාව විසින් 2024 නොවැම්බර් මාසයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද හා මධ්‍යම රජයෙන් / වෙනත් පළාත් සභාවලින් දකුණු පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කරන ලද ඉහත නිලධාරීන් සඳහා මෙම විභාගය ගාල්ල දිස්ත්‍රික්කයේදී පැවැත්වේ.

2.0 සුදුසුකම් හා විභාග පරිපාටිය -

(අ) සුදුසුකම් :- දකුණු පළාත් රාජ්‍ය සේවයේ බලයලත් නිලධාරී තනතුරෙහි II/I ශ්‍රේණි වල නිලධාරීන් මෙම විභාගය සඳහා සුදුසුකම් ලබයි.

(ආ) විභාග පරිපාටිය :- විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ. සමත්වීම සඳහා එක් එක් විෂයයක් සඳහා ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතුය

**II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**
(පත්වීම් දින සිට 04වන වැටුප් පියවරට පෙර සමත් විය යුතුය.)

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| 1. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පළාත් සභා නීති රීති | 100යි. | පැය 2යි. |
| 2. | ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | 100යි. | පැය 1යි. |
| 3. | මුදල් රෙගුලාසි | 100යි. | පැය 1යි. |
| 4. | පරිගණක පරීක්ෂණය (ලිඛිත) | 100යි. | පැය 1යි. |

විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| විෂයය අංකය | විෂයය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පළාත් සභා නීති රීති | I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි 13 වන සංශෝධනය<br>II. පළාත් සභා පනත හා එහි සංශෝධනය<br>III. 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂාංගික විධි විධාන පණත)<br>IV. පළාත් සභා ප්‍රඥප්තිය හා රෙගුලාසි<br>V. පලාත් සභාවේ සංවිධාන ව්‍යුහය, එහි විවිධ මට්ටම් හා පැවරෙන කාර්යයන් |
| 02 | ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | තනතුරට අදාළ වන පරිදි රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරී ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මඟින් තම අදහස් / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝගය අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද අපේක්ෂා කෙරේ. (ආයතන සංග්‍රහයේ 1 ඛණ්ඩය I, II, IV, V, VII, IX, XII, XIV, XXIII, XXIV, XXVII, XXVIII, XXX, XXXII පරිච්ඡේදයන් හා 11 ඛණ්ඩය XLVII, XLVIII පරිච්ඡේදයන් ) |
| 03 | මුදල් රෙගුලාසි | තනතුරට අදාල වන පරිදි රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. (මුදල් රෙගුලාසි සංග්‍රහයේ II, III, IV, V යන පරිච්ඡේදයන්) |
| 04 | පරිගණක පරීක්ෂණය (ලිඛිත) | වදන් සැකසුම (word processing), පැතුරුම්පත් (spread sheet), දත්ත සමුදාය (data base), ඉදිරිපත් කිරීම්/චිත්‍ර සටහන් (presentation/illustration), අන්තර්ජාලය (internet), විද්‍යුත් තැපැල (email) පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. |

**I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**
(I වන ශ්‍රේණියට පත්වී වසර 05ක් තුළ සමත් විය යුතු ය.)

| | විෂයය | ලකුණු | කාලය |
|---|---|---|---|
| 1. | විෂය බද්ධ කරුණු | 100යි. | පැය 2යි. |
| 2. | කළමනාකරණය | 100යි. | පැය 2යි. |

විභාගය සඳහා වන විෂය නිර්දේශය :-

| විෂයය අංකය | විෂයය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | විෂය බද්ධ කරුණු | 1972 අංක 09 දරණ ගෙවල් කුලී මණ්ඩල පනත හා එහි සංශෝධනයන් පිළිබඳව කාලීන දැනුම |
| 02 | කළමනාකරණය | I. කළමනාකරණ මූලධර්ම හා ඒ පිළිබඳ උපායමාර්ග<br>II. සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචනය<br>III. සංවර්ධන කටයුතු හා සංවර්ධනය පිළිබඳ සමස්ථ අරමුණු<br>IV. සන්නිවේදනය හා මහජන සම්බන්ධතා |

2.1 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පැවැත්වේ. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## 3.0 **විභාග ප්‍රතිඵල -**

දකුණු පළාත් ප්‍රධාන ලේකම් වෙත හා සියළුම අයදුම්කරුවන් වෙත මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා නිකුත් කරනු ඇත.

## 4.0 **විභාග ගාස්තු -**

පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවල දී විභාගය සඳහා පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව වශයෙන් එක් විෂයයකට රු. 250/- ක් බැගින් මාර්ගගත ව (Online) ගෙවිය යුතු වේ.

සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA** හෝ **MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මගින් සිදු කරනු ලබන ගෙවීම් කිසිඳු ආකාරයකින් පිළිගනු නොලැබේ. කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

## 5.0 **අයදුම්කළ යුතු පිළිවෙල -**

සියලුම අයදුම්කරුවන් www.psc.sp.gov.lk යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ඇති, විභාග සඳහා ලියාපදිංචි වීමේ කවුළුවට (Register for Exams) පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා යොමු කළ යුතු ය.

**(අයදුම්කරුවන් විසින් තම පෞද්ගලික ලිපි ගොනුව පවත්වාගෙන යනු ලබන ආයතනය නිවැරදිව මෙනුවෙන් තෝරා ගත යුතු වන අතර, වැරදි ආයතනයක් තෝරා ගත හොත් අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා යොමු නොවන බැවින් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව සැලකිය යුතු ය.)**

ආයතන ප්‍රධානියා විසින් අදාළ තොරතුරු පරීක්ෂාකර මාර්ගගතව නිර්දේශය ලබා දීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වනු ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව **2024 ඔක්තෝබර් 23 වන දින ප.ව. 11.59** න් අවසන් වේ.

5.1 අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම් පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු අතර, කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ අයදුම්පතක් එම නිලධාරියාගේ අනුදැනුමකින් තොරව සම්පූර්ණ නොකළ යුතු ය.

5.2 ආයතනික කටයුතු සඳහා අයදුම්පත බාගත කර මුද්‍රණය කර ගත හැකි අතර, කිසිදු ලෙසකින් අයදුම්පතේ දෘඩ පිටපත් මෙම කොමිෂන් සභාව වෙත එවීම නොකළ යුතු ය.

5.3 අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

5.4 වෙනත් ක්‍රම මඟින් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මාර්ගගතව මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී වැරදි විභාගයක් තේරීම වැනි අතපසුවීම්වලින් සිදුවන පාඩුව ඔබ විසින් විඳදරා ගත යුතු වේ.

**සැලකිය යුතුයි** - විභාගය සඳහා මාර්ගගතව ලියාපදිංචි වීම සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.

## 6.0 ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

විභාගය සඳහා අයදුම් කිරීමේ කාලය අවසන් වීමෙන් පසු දින 02ක කාලයක් තුළ එනම්, **2024 ඔක්තෝබර් 25 වන දින ප.ව. 11.59 දක්වා** අයදුම්පත් මාර්ගගතව නිර්දේශ කිරීමේ අවස්ථාව පවතී. ඒ සඳහා අදාළ ආයතනය විසින් නම් කළ මාණ්ඩලික නිලධාරියා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ඇති විභාග අයදුම්පත් නිර්දේශ කිරීමේ කවුළුවට පිවිස (Main menu > Exams > Exam Coordinator Login) අදාළ විභාගය තෝරා තම ආයතනය යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂාකර බලා නිර්දේශ කිරීමේ හැකියාව පවතී.

6.1 අයදුම්කරුවන් විසින් සපයා ඇති සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරු ව අයදුම්පත් නිර්දේශ කළ යුතු අතර, යම් හෙයකින් සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබියදී අයදුම්පත් නිර්දේශ කර ඇත්නම් ඒ පිළිබඳ වගකීම අදාළ මාණ්ඩලික නිලධාරියා විසින් දැරිය යුතු වේ. අයදුම්පතේ **රාජ්‍ය සේවය සම්බන්ධ තොරතුරු** සම්බන්ධයෙන් යම් අඩුපාඩුවක් වේ නම් එය සංශෝධනය (Edit) කිරීමේ හැකියාවද නිර්දේශ කරන නිලධාරියාට සලසා දී ඇත. අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වන අතර, නිර්දේශ නොකරන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු ලෙසකිනුදු නැවත සලකා බැලීමක් සිදු නොකෙරේ.

6.2 නිර්දේශ කිරීමේ කාලසීමාව අවසන් වූ පසු ස්වයංක්‍රීයව එම කවුළුව ක්‍රියා විරහිත වන අතර, නිර්දේශ නොකරන ලද අයදුම්පත් සියල්ල දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වීමකින් තොරව ප්‍රතික්ෂේප වනු ඇත.

6.3 සියළු අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු, නිර්දේශිත අයදුම්පත් ලේඛනය එම ස්ථානයෙන්ම බාගත කර ගත හැකි අතර, එය මුද්‍රණය කර මෙම කොමිෂන් සභාව වෙත තැපැල් මගින් එවීමට කටයුතු කළ යුතු ය.

6.4 ආයතනික කටයුතු සඳහා අයදුම්පත බාගත කර මුද්‍රණය කර ගත හැකි අතර, කිසිදු ලෙසකින් අයදුම්පතේ දෘඩ පිටපත් මෙම කොමිෂන් සභාව වෙත එවීම නොකළ යුතු ය.

## 7.0 ප්‍රවේශ පත්‍ර -

නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටීමට දකුණු පළාත්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඔබ ආයතනයේ සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියාවෙත කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර, වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුවට පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකිය.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර, ආයතන ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් අත්සන සහතික කරවා විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිඳු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

## 8.0 සාවද්‍ය තොරතුරු සැපයීම

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. තවද කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

9.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10.0 විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුශාංගික විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ගාමිණී වීරවික්‍රම**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත.

**ගාමිණී වීරවික්‍රම**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**දකුණු පළාත**

**(සැලකිය යුතුයි - ඔබ කාර්යාලයට අනුබද්ධව ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු, මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට ඉදිරිපත්වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් ඔවුන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.)**